# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1978 දෙසැම්බර් මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 30 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1978 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 45/78.

දාරිද්‍රතාවයට සහන සැලසීම සඳහා ද, අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම සඳහා ද, ආගම නංවාලීම සඳහා ද, ජාතිය වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සඳහා ද, මහජනතාවගේ සුභ සිද්ධිය හෝ යහපත පිණිස වූ වෙනත් යම් කාර්ය සඳහා ද මුදල් සැපයීම පිණිස "ජනාධිපතිවරයාගේ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන,) "ජනාධිපතිවරයාගේ අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ජනාධිපතිවරයාගේ අරමුදල පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් අරමුදලට නියම කර ඇති නාමයෙන් ඒ අරමුදල අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු ය ; තව ද එකී නාමයෙන් අරමුදල විසින් නඩු පැවරීම ද අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. (1) අරමුදල පිළිබඳ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සමන්විත වන පාලක මණ්ඩලයක් වෙත සතු විය යුතු ය. අරමුදලෙහි පාලක මණ්ඩලය.

(2) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන, අරමුදල පිළිබඳ පාලක මණ්ඩලය—

(අ) ජනරජයේ ජනාධිපතිවරයාගෙන් ;

(ආ) අග්‍රාමාත්‍යවරයාගෙන් ;

(ඇ) කථානායකවරයාගෙන් ;

(ඈ) විරුද්ධ පක්ෂයේ නායකවරයාගෙන් ;

(ඉ) ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගෙන් ; සහ

(ඊ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද, ජනාධිපතිවරයා විසින් එක් එක් තැනැත්තා වෙත නිකුත් කරන ලද පත්වීම් ලිපියෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා ඒ එක් එක් තැනැත්තා විසින් (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුතු වූ ද, වෙනත් සාමාජිකයන් දෙදෙනකුගෙන්

සමන්විත විය යුතු ය.

ජ 37295—10,200 (78/11)

(3) ජනාධිපතිවරයා විසින් (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකුගේ පත්වීම, ජනාධිපතිවරයා විසින් තම පරම අභිමතය පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලැබූ, මණ්ඩලයේ යම් සාමාජිකයකුට, තමා අස්වන බවට වූ ලිපියක් ජනාධිපතිවරයා අමතා යැවීමෙන්, ඕනෑම අවස්ථාවක දී මණ්ඩලයෙන් අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය ද ඒ රැස්වීම්වල කටයුතු ද මණ්ඩලය විසින් විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

(7) ජනාධිපතිවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

මණ්ඩලයේ බලතල.

4. (1) මණ්ඩලයට, අරමුදලෙහි නාමයෙන්—

(අ) චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමේ, දැරීමේ හෝ කළමනාකරණය කිරීමේ;

(ආ) අරමුදලට හිමිකම ලැබෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ නැතහොත් ඒ දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ;

(ඇ) මේ පනතේ විධිවිධාන බලගැන්වීම පිණිස අවශ්‍ය සියලු ක්‍රියා හෝ දේ කිරීමේ

බලය තිබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන "ජනාධිපතිවරයාගේ අරමුදල—අවිනිශ්චිත ගිණුම" නමැති ගිණුමෙහි බැරට ඇති සියලු මුදල්, මේ පනත ආරම්භ වන දින සිට, අරමුදල සතු විය යුතු ය.

ජනාධිපතිවරයාගේ අරමුදල් ගිණුම.

5. මණ්ඩලය විසින් "ජනාධිපතිවරයාගේ අරමුදල් ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පවත්වා ගෙන යා යුතු අතර ඒ ගිණුමට—

(අ) 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය ක්‍රියාත්මකවීමේ හේතුවෙන් අරමුදල සතු වන සියලු මුදල්; සහ

(ආ) මේ පනත ආරම්භ වන දිනයට පසු අරමුදලට උපචිත වන සියලු මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

අරමුදලේ මුදල් යොදවනු ලැබිය හැකි කාර්ය.

6. අරමුදලට අයත් මුදල්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට—

(අ) දාරිද්‍රතාවයට සහන සැලසීම සඳහා ; හෝ

(ආ) අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම සඳහා ; හෝ

(ඇ) ආගම නංවාලීම සඳහා හෝ ආගමික වත් පිළිවෙත් පවත්වා ගෙන යාම සඳහා ; හෝ

(ඈ) ජාතිය වෙනුවෙන් සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සඳහා ; හෝ

(ඉ) ජනාධිපතිවරයාගේ හා මණ්ඩලයේ මතය අනුව, මහජනතාවගේ සුභ සිද්ධිය හෝ යහපත පිණිස වූ වෙනත් යම් කාර්යයක් සඳහා

ජනාධිපතිවරයාගේ විධානවලට යටත්ව, යොදා ගැනීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

අරමුදලේ මුදල් ආයෝජනය කිරීම.

7. අරමුදලට අයත් යම් මුදලක් ජනාධිපතිවරයා විසින් දෙනු ලබන යම් විධානවලට යටත්ව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

අරමුදලෙහි නිලධරයෝ සහ සේවකයෝ.

8. ජනාධිපතිවරයාගේ විධානවලට යටත්ව, මණ්ඩලයට—

(අ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන අරමුදලේ යම් නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට ;

(ආ) එසේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික නිශ්චය කිරීමට ;

(ඇ) ඒ පාරිශ්‍රමික සහ අරමුදලේ කටයුතු පරිපාලනය කිරීමෙහි ලා දරන ලද වෙනත් වියදම් අරමුදලේ ආදායමෙන් ගෙවීමට

බලය තිබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

9. (1) අරමුදලේ ආදායම සහ වියදම පිළිබඳව නිසි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයක දී ම අරමුදලේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය. ඒ ගිණුම් විගණනය කිරීමේ දී තමාට සහාය වීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයා විසින් යම් සුදුසුකම් ලත් විගණකවරයකුගේ සේවය ලබා ගනු ලැබිය හැකි අතර, ඒ විගණකවරයා විසින් විගණකාධිපතිවරයාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) අරමුදලේ ගිණුම් විගණනය කිරීමෙහි ලා විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් පියවීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් අරමුදලේ ආදායමෙන් විගණකාධිපතිවරයාට ගෙවනු ලැබිය යුතු ය. විගණකාධිපතිවරයාට අරමුදලින් ලැබෙන යම් පාරිශ්‍රමිකයකින්, ඒ විගණනයේ කාර්යය සඳහා ඔහු විසින් සේවයෙහි නියුක්ත කර ගන්නා ලද යම් සුදුසුකම්

ලත් විගණකවරයකුට හෝ විගණකවරයන්ට ඔහු විසින් ගෙවන ලද යම් මුදලක් අඩු කර ගැනීමෙන් පසුව, ඒ පාරිශ්‍රමිකයේ ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනට පසු හැකිතාක් ඉක්මණින් විගණකාධිපතිවරයා විසින් ඒ වර්ෂය තුළ අරමුදලේ ආදායම හා වියදම පිළිබඳ සහ අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශයක්ද සමග ඒ වර්ෂය තුළ අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාවක් පිළියෙළ කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යන යෙදුමෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ

අදහස් වේ.

විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ ප්‍රකාශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව.

**10.** විගණකාධිපතිවරයා විසින් 9 වන වගන්තියේ (4) වන උපවගන්තිය අනුව පිළියෙළ කරනු ලබන වාර්තාව සහ ප්‍රකාශය ඔහු විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර, ඒ අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව සහ ප්‍රකාශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

රීති සෑදීමට මණ්ඩලයට ඇති බලය.

**11.** මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කටයුතු කිරීම හා කාර්ය ඉටු කිරීම කෙරෙහි බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කාරණයක් සම්බන්ධයෙන් අවශ්‍ය යයි මණ්ඩලය සලකන රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

අරමුදලේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**12.** අරමුදලේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**13.** මේ පනතෙහි "ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් මුදල් නීති පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.